කසළ බැහැර කිරීම සඳහා දින නියම කර ඇත. වැඩි විස්තර සඳහා කරුණාකර කසළ බැහැර කිරීමේ කැලැන්ඩරය පරීක්ෂා කරන්න. කරුණාකර නියමිත දිනයේ **උදෑසන 8:30 වන විට**, කසළ එකතු කරන ස්ථානයට කසළ දමන්න. පරිශීලකයන් විසින් කසළ එකතු කිරීමේ ස්ථාන කළමනාකරණය කරනු ලැබේ. භාවිතය ආරම්භ කිරීම සඳහා කරුණාකර එකතු කිරීමේ ස්ථානයේ කළමනාකරුට දුරකථන අංකයක් ලබා දෙන්න.

Sanbu-gunshi පාරිසරික සනීපාරක්ෂක සංගමයේ කසළ බැහැර කරන ආකාරය

විශාල කසළ නිවසට පැමිණ එකතු කර ගැනීමට සහ කෙලින්ම අප වෙත රැගෙන ඒම සඳහා අවශ්‍ය වන අන්තර්ජාල වෙන් කර ගැනීම දවසේ පැය 24 පුරාම සහ වසරේ දින 365 පුරාම සිදු කර ගත හැක. වැඩි විස්තර සඳහා කරුණාකර වෙබ් පිටුව බලන්න.

කරුණාකර නීති වලට අනුකූලව සහ නිවැරදිව කසළ බැහැර කරන්න.

ඔබට නම් කරන ලද කසළ බෑගය ගැටගැසීමට නොහැකි අවස්ථාවක කරුණාකර විශාල කසළ නිවසින් එකතු කර ගැනීමට අයදුම් කිරීම හෝ කසළ එකතු කිරීමේ ස්ථානයට කෙලින්ම රැගෙන ඒම සිදු කරන්න.

සීමිත සම්පත් සහ පෘථිවිය ආරක්ෂා කිරීම සඳහා

ඔබ මිලදී ගන්නා සමහර ප්ලාස්ටික් බෑග්, දහනය කල හැකි කසළ බැහැර කිරීමට භාවිතා කළ හැක.

වෙබ් පිටුව | Gomi-Saku | කසළ වෙන් කිරීමේ යෙදුම (iOS උපාංග (iPhone සහ iPad සඳහා) (ගැලපෙන OS: iOS 9.0 හෝ ඊට වැඩි)) | කසළ වෙන් කිරීමේ යෙදුම (Android උපාංග (ගැලපෙන OS: Android 4.4 හෝ ඊට වැඩි))

දහනය කල හැකි කසළ

දහනය කල හැකි කසළ (ඉතා විශාල) උර 20ක් ඇතුළත් යෙන් 1000 (බදු ඇතුළුව)

දහනය කල හැකි කසළ (විශාල) උර 20ක් ඇතුළත් යෙන් 800 (බදු ඇතුළුව)

දහනය කල හැකි කසළ (කුඩා) උර 20ක් ඇතුළත් යෙන් 600 (බදු ඇතුළුව)

- **ඉදුල්**
  [ඉවත දැමීමට පෙර ජලය මිරිකා හරින්න]

- **සම්(ලෙදර්) භාණ්ඩ**
  (සපත්තු, බෑග්, බද පටි ආදිය)

- **ප්ලාස්ටික් වර්ග** (සෙල්ලම් බඩු, ෂැම්පු/සේදුම්කාරක සඳහා වන බහාලුම්, සීඩී/එම්ඩී ආදිය)

ප්ලාස්ටික් ටැංකි තුළ දැවෙන වායුව ඉතිරි වීමේ අවදානමක් ඇති බැවින් දහනය කළ නොහැකි කසළ ලෙස බැහැර කරන්න.



- **කඩදාසි වර්ග**
  (ඉවත දැමිය හැකි ඩයපර් වලින් අපද්‍රව්‍ය ඉවත් කරන්න)



- **රබර් වර්ග**

- **ලී භාණ්ඩ** (ලී පුවරු, කුරු, අතු ආදිය)
  [විෂ්කම්භය සෙන්ටිමීටර 10ක් හෝ ඊට අඩු, දිග සෙන්ටිමීටර් 30ක් හෝ ඊට අඩු කැබලිවලට කපන්න]

- **ස්ටයිරෝෆෝම් (රිජිෆෝම්)**
  [කුඩා කැබලිවලට කපා බෑගයක දමන්න]



- **වෙනත් රෙදි වර්ග**
  (කුඩා කුෂන්, පිරවූ බෝනික්කන්, එක් වරක් භාවිතා කරන අත් උණුසුම්කාරක (කයිරෝ), කපන ලද තණකොළ (පස ඉවත් කරන්න), සිගරට් කොට ආදිය)

සැලැස්ම
- ○ ෂැම්පු,සේදුම්කාරක යනාදිය බැහැර කිරීමට පෙර ඒවායේ අන්තර්ගතය සියල්ල භාවිතා කරන්න.
- ○ නිල් ශීට් ආදී විශාල වස්තූන් සෙන්ටිමීටර 30×30 කොටු හෝ ඊට අඩු කැබලිවලට කපන්න.

ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි කසළ

*● **සලකුණේ සඳහන් කර ඇති ලෙස කසළ වර්ගීකරණය කර වෙන් වෙන් වශයෙන් බෑග්වලට දමන්න.**
(කාණ්ඩයට අදාළ නොවන දේවල් බෑග්වල මිශ්‍ර වී ඇති අවස්ථාවල, ඒවා එකතු කරනු නොලැබේ.)

ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි කසළ උර 10ක් ඇතුළත් යෙන් 200 (බදු ඇතුළුව)

- **කෑන් සහ වීදුරු බෝතල් (මිශ්‍ර කළ හැක)**
  - ◇ කෑන්: බීම වර්ග, මධ්‍යසාර අඩංගු ඒවා පමණි.
  - ◇ වීදුරු බෝතල්: බීම වර්ග, මධ්‍යසාර, කුළුබඩු, ආහාර, ඖෂධ හෝ ආහාර පිසීමට ගන්නා තෙල් අඩංගු ඒවා පමණි.

*වීදුරු බෝතල් මූඩි ඉවත් කළ යුතුය.
*කෑන් සහ වීදුරු බෝතල්වල අඩංගු ද්‍රව්‍ය ඉවත් කර ජලයෙන් සෝදා හරින්න.

සැලැස් : පළිබෝධනාශක බෝතල් බැහැර කළ නොහැක.
ටින් කළ භාණ්ඩ සහ රසකැවිලි ටින් දහනය කල නොහැකි කසළ ලෙස බැහැර කළ යුතුය.
රූපලාවණ්‍ය ද්‍රව්‍ය අඩංගු බෝතල් දහනය කළ නොහැකි කසළ ලෙස බැහැර කළ යුතුය.
බෝතල් මූඩි → ලෝහමය මූඩි දහනය කල නොහැකි කසළ ලෙස බැහැර කරන්න. / → ප්ලාස්ටික් මූඩි දහනය කල හැකි කසළ ලෙස බැහැර කරන්න.

- **ප්ලාස්ටික් බෝතල්**
  - ◇ **බීම වර්ග සහ කුළුබඩු** අඩංගු වූ ප්ලාස්ටික් බෝතල් පමණි.
    1. **PET ලෙස සඳහන් කර ඇති ඒවා** පමණි
    2. මූඩිය සහ ලේබලය ඉවත් කරන්න.
    3. අන්තර්ගතය ඉවත් කර ජලයෙන් සෝදන්න.



ෂැම්පූ සහ සේදුම්කාරක වැනි බහාලුම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.

ප්ලාස්ටික් බෝතල් බැහැර කරන ආකාරය
1) ජලයෙන් සේදීම. 2) වෙන් කිරීම.



බෝතල් මූඩි සහ ලේබලය දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.
ප්ලාස්ටික් බෝතල් ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.

- **ඇඳුම්**
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
  *යට ඇඳුම්, මේස් සහ ඉරුණු ඇඳුම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.

- **වෙනත් රෙදි වර්ග**
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
  *ඇඳ රෙදි, කර්ටන්, තුවා-බ්ලැන්කට් සහ රෙදි රෝල් පමණි.



- **සඟරා**
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
  *පෙළපොත්, පොත් සහ ශබ්ද කෝෂ ද මේ සමග බැහැර කළ හැක.

- **පුවත්පත්**
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
  *අත් පත්‍රිකා සහ දැන්වීම් පත්‍රිකා ද මේ සමග බැහැර කළ හැකිය.

- **කඩදාසි ඇසුරුම්**
  පාන වර්ග අන්තර්ගත වූ කඩදාසි ඇසුරුම් පමණි.
  ඇතුළත ජලයෙන් සෝදා හැර, ඇසුරුම කපා විවෘත කර වියළන්න.
  *ඇතුළත ඇලුමිනියම් සහිත ඇසුරුම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.



- **සුදු පැහැති ආහාර තැටි (සුදු පැහැති ෆොම් ස්ටයිරෝෆෝම් වලින් සාදා ඇති)**
  ආහාර තැටි පමණි.
  ජලයෙන් සෝදා, හොඳින් වියළන්න.
  *තැටි මත වර්ණ, අක්ෂර ආදී රටා ඇත්නම් සහ පිරිසිදු කිරීමට අපහසු නම් ඒවා දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.



- **කාඩ්බෝඩ්**
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බෑගය හොඳින් ගැටගසන්න.)
  *වැක්ස් වැනි ආලේපන ගල්වා ඇත්නම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න
  *ප්‍රමාණයෙන් විශාල ඒවා බෑගයේ ප්‍රමාණයට කපන්න.



දහනය කළ නොහැකි කසළ

*● **සලකුණේ සඳහන් කර ඇති ලෙස කසළ වර්ගීකරණය කර වෙන් වෙන් වශයෙන් බෑග්වලට දමන්න.**
(කාණ්ඩයට අදාළ නොවන දේවල් බෑග්වල මිශ්‍ර වී ඇති අවස්ථාවල, ඒවා එකතු කරනු නොලැබේ.)

දහනය කළ නොහැකි කසළ උර 10ක් ඇතුළත් යෙන් 200 (බදු ඇතුළුව)

- **මැටි භාණ්ඩ සහ වීදුරු වර්ග**
  (ආහාර ගන්නා පාත්‍ර, පිඟන්, මල් බඳුන්, රූපලාවන්‍ය ද්‍රව්‍ය අඩංගු බෝතල්, බීදුණු බෝතල්, ජනෙල් වීදුරු, වීදුරු කැබලි, කණ්ණාඩි, කෝප්පප ආදිය)

*වීදුරු වැනි බිඳුණු ද්‍රව්‍ය අනතුරුදායක බැවින් බෑගයට දැමීමට පෙර කඩදාසියකින් ඔතන්න.

- **ලෝහ වර්ග සහ වෙනත්**
  (ගෑස් ලිප් මේස, ගෑස් සිලින්ඩර්, කේතල්, ටින්කල ආහාර බඳුන්, රසකැවිලි අන්තර්ගත වූ ටින්, ස්ප්‍රේ ටින්, භාජන, කුඩ, දිගු කිරීමේ රැහැන්, ප්ලාස්ටික් ටැංකි, කොට්ට, කුෂන්, බ්ලැන්කට්, වීඩියෝ පට, ජලනළ ආදිය)

*ස්ප්‍රේ ටින් සහ ගෑස් සිලින්ඩර් ආදියෙහි අන්තර්ගතය අවසන් වන තුරු භාවිතා කර සිදුරු නොකර කසළ බෑගයට දමන්න.

කුඩ කසළ බෑගයෙන් පිටතට විත් තිබීම ගැටලුවක් නොවේ.

- **කුඩා ගෘහ උපකරණ/ නැවත ආරෝපණය කළ හැකි කුඩා ගෘහ උපකරණ**
  (සංගීත වාදක, වැකුම් ක්ලීනර්, ඔරලෝසු, ස්පීකර්, වීඩියෝ කැමරා, මොබයිල් බැටරි, අත් පංකා, විදයුත් දුම්වැටි, විදුලි දත් බුරුසු, විදුලි කේතල් ආදිය)

*ලෝහ පර්යන්ත කොටස් ටේප් හෝ වෙනත් ආකාරයකින් ඔතන්න.
*උපකරණවල ඇති පුද්ගලික තොරතුරු මකා දමන්න.
*නැවත ආරෝපණය කළ හැකි කුඩා ගෘහ උපකරණ බැහැර කිරීමේ දී, ඒවායේ බැටරි සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමෙන් පසු බැහැර කරන්න.
*ඉදිමී ඇති නැවත ආරෝපණය කළ හැකි බැටරි ගිනි ගැනීමේ අවදානමක් ඇති බැවින්, ඒවා කසළ උරවලට නොදමා, කෙලින්ම රැගෙන එන්න.

සැලැස්ම
- ○ ටින් කළ ආහාරවල අඩංගු ද්‍රව්‍ය දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.
- ○ ඉතුරු වූ රූපලාවන්‍ය ද්‍රව්‍යවල ගිනි නොගන්නා දේවල් රෙදි කැබැල්ලකට පොඟවා එය දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.
- ○ නම් කරන ලද කසළ බෑග්වලට දැමිය නොහැකි කසළ විශාල කසළ ලෙස සැලකේ.

අන්තරායක කසළ

අන්තරායක කසළ උර 5ක් ඇතුළත් යෙන් 100 (බදු ඇතුළුව)

- **භාවිතා කළ වියළි කෝෂ**

*ලෝහ පර්යන්ත කොටස් ටේප් හෝ වෙනත් ආකාරයකින් ඔතන්න.

- **රසදිය උෂ්ණත්වමාන**

- **විදුලි බුබුළු, ප්‍රතිදීප්ත පහන්**

දිගු ප්‍රතිදීප්ත පහන් කසළ බෑගයෙන් පිටතට පැමිණ තිබීම ගැටලුවක් නොවේ.

*මෙම පිටත ඇසුරුම් උරයට ද අන්තරායක කසළ දමා බැහැර කළ හැකිය.

*විදුලි බුබුළු සහ ප්‍රතිදීප්ත විදුලි පහන් කඩදාසියක ඔතා නියමිත බෑග්වලට දැමිය යුතුය.

- **තියුණු තල**

*පේපර් කටර් වල තල ටින් එකකට දමා බැහැර කරන්න.
*පිහි ආදිය සඳහා තලය වටේ රෙද්දක් ඔතා 刃物 (はもの) ලෙස සටහන් කරන්න.

- **ලයිටර්**



*ලයිටර් බැහැර කිරීමට පෙර එහි අන්තර්ගතය හිස් කරන්න.

විශාල කසළ — නිවසට පැමිණ එකතු කර ගැනීමට අයදුම් කරන්න

- කසළ එකතු කිරීමේ දින නියම කර ඇති බැවින් කරුණාකර කසළ බැහැර කිරීමේ දින දර්ශනය පරීක්ෂා කරන්න.
- සංගමයේ බල සීමාව තුළ ජීවත් වන අයට මෙම සේවාව භාවිතා කළ හැකිය.
- විශාල කසළ යනු නම් කරන ලද බෑග් වලට අදාළ නොවන කසළ වේ.
- ව්‍යාපාරික කටයුතුවලින් බැහැර කරනු ලබන කසළ මෙයට අදාළ නොවේ.

අයදුම් කිරීම:
☎ 0479-86-3516
අන්තර්ජාලය හරහා ලියාපදිංචිය
නිවසට පැමිණ විශාල කසළ එකතු කර ගැනීමට අයදුම් කිරීම සඳහා

<භාවිතය සඳහා උපදෙස්>
***අන්තර්ජාලය හරහා වෙන්කරවා ගැනීම සඳහා, කරුණාකර QR කේතය ස්කෑන් කර, උපදෙස්වලට අනුව වෙන් කරවා ගන්න.**
***දුරකථනය මගින් වෙන් කරවා ගැනීමේ දී, පෙර දිනය රජයේ නිවාඩු දිනයක් වන්නේ නම්, ඊට පෙර ආසන්නම සතියේ දිනයේ දහවල් 12:00 වේ.**

1) අයදුම් කිරීම (කසළ එකතු කරන දිනට පෙර දින දහවල් වන විට වෙන්කරවාගෙන තිබිය යුතුය)
කරුණාකර ඔබගේ ලිපිනය, නම, සම්බන්ධතා තොරතුරු සහ ඔබ බැහැර කරන අයිතමය සහ අයිතම ගණන දන්වන්න.

2) විශාල කසළ ස්ටිකර් මිලදී ගෙන ඒවා විශාල කසළවල අලවන්න.
එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ස්ටිකර් ඇලවිය යුතුය.
*විශාල කසළ ස්ටිකර්, කසළ බෑග් අලෙවිකරන වෙළඳසැල් වලින් මිලදී ගත හැකිය.
(කසළ උර අලෙවි කරන ඇතැම් වෙළඳසැල්වල මේවා නොතිබිය හැකිය.)

3) කරුණාකර ඔබේ කසළ, එකතු කරන දින උදෑසන 8:30 වන විට ඔබේ ගෙවත්ත වැනි පාරට පෙනෙන ස්ථානයකට දමන්න.
*කරුණාකර එකතු කිරීමට නම් කරන ලද අයිතමවලට අමතර දේවල් ඒ සමඟ බැහැර නොකරන්න.

විශාල කසළ ස්ටිකරය 1ක් යෙන් 200 (බදු ඇතුළත්)

ගෘහ උපකරණවල ප්‍රතිචක්‍රීකරණය කිරීමේ නීතියට යටත් අයිතම

*වායු සමීකරණ යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, ශීතකරණ, අධිශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර හෝ ඇඳුම් වියළන යන්ත්‍ර සංගමය විසින් බාර ගනු නොලැබේ.

ප්‍රතිචක්‍රීයකරණය සිදු කරන ආකාරය
- කරුණාකර පහත ක්‍රමවලින් එක් ක්‍රමයක් භාවිතා කරන්න.

1 වන ක්‍රමය : ඔබ අතීතයේ භාණ්ඩය මිලදී ගත් වෙළඳසැලෙන් හෝ ඔබ නව භාණ්ඩයක් මිල දී ගන්නා වෙළඳසැලෙන් එය රැගෙන යන මෙන් ඉල්ලුම් කරන්න.
2 වන ක්‍රමය: තැපැල් කාර්යාලයේ ප්‍රතිචක්‍රීකරණ ගාස්තුව ගෙවීමෙන් පසු, අයිතමය සෘජුවම නියමිත එකතු කරන ස්ථානයට ප්‍රවාහනය කරන්න.
3 වන ක්‍රමය: Renet Japan (SG Moving Co., Ltd.) මගින් සිදුකර ගන්න. අයදුම් කිරීම සඳහා, කරුණාකර පහත දුරකථන අංකය මගින් හෝ QR කේතය ස්කෑන් කිරීමෙන් ඉල්ලුම් කරන්න. **ගිවිසුම්ගත සමාගම: SG Moving Co., Ltd. ☎ 0570 (056) 006**
4 වන ක්‍රමය : සංගමය වෙතින් බලපත්‍ර ලත් වෙළඳ සමාගමකින් ඉල්ලා සිටින්න. (කරුණාකර ගාස්තු ආදිය සඳහා බලපත්‍රලාභී වෙළඳ සමාගම සම්බන්ධ කරගන්න.)
බලපත්‍රලාභී වෙළඳ සමාගම්: Gendai Kogyo ☎ 0479 (74) 7887, Sanbu Clean Service ☎ 0479 (86) 5459

Renet Japan

නම් කරන ලද එකතු කිරීමේ ස්ථාන	Nippon Express, 1-8-7 Osaku, Sakura City, ☎ 043 (498) 0856 Nanso Transport Mobara Branch, 1193-1 Yamanne, Nagara-machi, Chosei District, ☎ 0475 (30) 7333 Konan Unyu Logistics Center Co., Ltd. 2831-18, Sunayama, Kamisu City, Ibaraki Prefecture ☎ 0479 (46) 2400

*නම් කරන ලද එකතු කිරීමේ ස්ථාන විවෘතව ඇති දින සහ වේලාවන් දකුණු පස ඇති URL එකෙන් කලින් පරීක්ෂා කරගන්න.
https://www.rkc.aeha.or.jp/info/overview.html
*තැපැල් කාර්යාලය ප්‍රතිචක්‍රීකරණ ගාස්තු ගෙවීමේ කවුළුවක් පමණක්ම වන අතර, ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ නොවේ. ප්‍රතිචක්‍රීකරණ ගාස්තු හෝ ගෘහ විදුලි උපකරණ ප්‍රතිචක්‍රීකරණ නීතියට අයත් වේද යන්න පිළිබඳව ඔබට ගැටලු පවතී නම්, කරුණාකර පහත සඳහන් ස්ථානයෙන් විමසන්න.
විමසීම්: ගෘහ විදුලි උපකරණ සංගමයේ ගෘහ විදුලි උපකරණ ප්‍රතිචක්‍රීකරණ ටිකට්පත් මධ්‍යස්ථානය (**☎ 0120-319-640**)
වෙබ් පිටුව https://www.rkc.aeha.or.jp

සංගමය විසින් එකතු නොකරන කසළ

*කරුණාකර විශේෂඥ සමාගමක් සම්බන්ධ කරගන්න.

කෘෂිකාර්මික ද්‍රව්‍ය (කෘෂිකාර්මික වයිනයිල්, විශාල කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, පළිබෝධනාශක, පළිබෝධනාශක බහාලුම්, රසායනික බහාලුම්), ගෑස් සිලින්ඩර්, වාහන අමතර කොටස්, අළු, ඔයිල් (වාහන තෙල්), බැටරි, ටයර්, ගිනි නිවන උපකරණ, විශාල වාණිජ විදුලි උපකරණ, තීන්ත, සිරින්ජර, සිරින්ජර කටු, පියානෝ, මොනිටර්, ඉදිකිරීම් අපද්‍රව්‍ය, ගඩොල්, උළු, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, 50cc ට වැඩි යතුරුපැදි, පස්, කොන්ක්‍රීට්, ජංගම දුරකථන ආදිය.

කසළ කෙලින්ම සංගමයට රැගෙන ඒම

අයදුම් කිරීම: ☎ 0479-86-3516
අන්තර්ජාලය හරහා ලියාපදිංචිය

*අනිවාර්යයෙන්ම කසළ නියමිත ලෙස වෙන් කර රැගෙන එන්න.
*විශාල කසළ හෝ එකවර බැහැර කිරීම සඳහා කසළ විශාල ප්‍රමාණයක් තිබේ නම්, එය කෙලින්ම සංගමයට රැගෙන යා හැකිය.
- කසළ රැගෙන ඒම සඳහා භාවිතා කරන වාහනය, උපරිම ටොන් 2ක (මුළු දිග මීටර් 5ට අඩු) ප්‍රමාණයේ වාහනයක් විය යුතුය.
- නම් කරන ලද කසළ බෑග් සහ විශාල කසළ ස්ටිකර් අවශ්‍ය නොවේ.
- ඔබගේ වාහනයේ කසළ ගොඩබෑමේ වගකීම ඔබ සතුය.කාර්ය මණ්ඩලයේ උපදෙස් පිළිපදින්න.
- ගස්වල අතු ආදිය ඝනකම සෙන්ටිමීටර 10 ට වඩා අඩු, දිග මීටර් 1 ක් විය යුතු අතර දිනකට වොන් 1 දක්වා එකතු කරනු ලැබේ. කරුණාකර නිල් ශීට් ආදිය රැගෙන ඒමට පෙර ඒවා සෙන්ටිමීටර 50×50 ට වඩා අඩු වන සේ කපා ගන්න.
- එක් දිනක් තුළ තනිම විශාල ප්‍රමාණයක් රැගෙන පැමිණෙන අවස්ථාවල, එයට සීමා පැනවීමට ඉඩ ඇත.
- කරුණාකර පටවන ලද අයිතම ඉක්මනින් වාහනයෙන් බාගැනීමට පහසු වන පරිදි ඒවා වෙන් කිරීමට කටයුතු කරන්න.
- සුරතල් සතුන් (කුඩා සතුන් පමණි) ආදියේ මළ සිරුරු ද රැගෙන ආ හැකිය.

රැගෙන එන දිනය	සඳුදා සිට සිකුරාදා (ඊසර අවසාන,අලුත් අවුරුදු නිවාඩු සහ නිවාඩු දින හැර)	සෑම මසකම 2 වන සතියේ ඉරිදා දින
රැගෙන එන වේලාව	පෙ:ව 9 සිට 11, ප:ව 1 සිට 4 දක්වා	පෙ:ව 9 සිට 11 *සවස් කලයේ රැගෙන යා නොහැක.
දුරකථනයෙන් වෙන් කරවා ගැනීම	**පෙර දින වෙන්කරවා ගැනීම අවශ්‍ය වේ.** *පෙර දිනය වන්නේ ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් නම්, වහාම පෙර සෙනසුරාදා හැර සතියේ දිනයක වෙන්කරවා ගැනීම සිදු කරන්න.	**සඳුදා සිට සිකුරාදා දක්වා (නිවාඩු දින හැර) දුරකතනයෙන් කලින් වෙන් කර ගත යුතුය.** *සති 2කට පෙර සිට වෙන් කර ගත හැක. (වෙන් කිරීම් සිදු කරන ආකාරය)
අන්තර්ජාලය හරහා වෙන්කරවා ගැනීම	**කරුණාකර QR කේතය ස්කෑන් කර, උපදෙස් වලට අනුව වෙන් කරවා ගන්න.**	
ගාස්තු	**• කසළ බැහැර කිරීම: කිලෝ ග්‍රෑම් 10 කට යෙන් 100 (කිලෝ ග්‍රෑම් 10 ට අඩු වුවද යෙන් 100) • සුරතල් සතුන් (කුඩා සතුන් පමණි) ආදියේ මළ සිරුරු එකකට යෙන් 500**	

කසළ බැහැර කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

- **කරුණාකර දහනය කළ හැකි කසළ, දහනය කළ හැකි කසළ එකතු කරන ස්ථානයට සහ දහනය කළ නොහැකි, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සහ අනතුරුදායක කසළ, දහනය කළ නොහැකි කසළ එකතු කරන ස්ථානයට බැහැර කරන්න.**
- **දහනය කළ නොහැකි, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සහ අනතුරුදායක කසළ වර්ග අනුව එකතු කරනු ලැබේ, එබැවින් කසළ එකතු කිරීම සම්පූර්ණ කිරීමට දින කිහිපයක් ගත විය හැකිය.**
- **දහනය කළ හැකි සහ දහනය කළ නොහැකි කසළ එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙනස් විය හැකි බව කරුණාවෙන් සලකන්න.**
- **සුළිසුලං හෝ අධික හිම වැනි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් කසළ එකතු කිරීම කළ නොහැකි විය හැක.**

කසළ සැකසුම් පහසුකම

Sanbu-gunshi පාරිසරික සනීපාරක්ෂක සංගමය

1149-1 Kanno, Matsuo-machi, Sammu City ☎ 0479-86-3516 පිළිගැනීමේ වේලාවන් 8:30-17:15

කසළ රැගෙන ඒමේ දිනය: සඳුදා සිට සිකුරාදා (නිවාඩු දින හැර) **කසළ රැගෙන ඒමේ වේලාව 9:00-11:00, 13:00-16:00**
කසළ රැගෙන ඒමේ දිනය: 2 වන ඉරිදා **කසළ රැගෙන ඒමේ වේලාව 9:00-11:00**

2026 මූල්‍ය වර්ෂය *රූපසටහන් සැපයීම: ආර්ථික, වෙළඳ හා කර්මාන්ත අමාත්‍යාංශය සහ පරිසර අමාත්‍යාංශය